සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# භූගෝල විද්‍යාව

**09 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

## I කොටස

- දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක 01 - 05 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01 ඕසෝන් ස්ථරය ..................................................................... ගෝලයේ පිහිටා ඇත. (පරිවර්ති / අපරිවර්ති / මෙසෝ)

02 කෘෂිකර්මයට මෙන්ම ජනාවාස ඉදිකිරීමට ද .................................... ඉතා සුදුසු වේ. (සානු / තැනිතලා / බෑවුම්)

03 ආකර කර්මාන්තය සඳහා අවශ්‍ය ඛණිජ සම්පත් ................................................ ප්‍රදේශ ආශ්‍රිතව බහුලව දැකිය හැකිය. (සානු / කඳු මුදුන් / පළිහ)

04 ගොඩබිම ජලයෙන් 0.62% ක් ......................................... ජලය ලෙස සකස් වී ඇත. (භූතල / භූගත / සාගර)

05 නිරපේක්ෂ පිහිටීම අනුව ආසියානු කලාපය නැගෙනහිර දේශාංශ ................................. දක්වා පැතිර තිබේ. ($25^{o}$ / $80^{o}$ / $180^{o}$)

- අංක 06 - 10 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියා දක්වන්න.

06 නිරන්තරයෙන් ජලගැලීම්වලට ලක්වන රටක් ලෙස .................................. දැක්විය හැකිය.

07 වායු, ජල, ශිලා හා ජෛව ගෝල අතර ජලය හුවමාරු වීමේ ක්‍රියාවලිය ............................................................... වේ.

08 වී, කපු, තිරිඟු, තේ වැනි විවිධ වූ වගාවන් දක්නට ලැබෙන්නේ ....................................... ආසියා කලාපයේ ය.

09 මධ්‍යම ආසියාවට අයිති කාන්තාරයක් ලෙස ................................................ දැක්විය හැකිය.

10 ලෝකයේ භූ විද්‍යා පාරාදීසය ලෙස හඳුනාගත්තේ ...................................... කඳුවැටිය වේ.

- අංක 11 - 15 දක්වා වූ ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

11 ආසියාවේ ඉරාන හා ඩෙකෑන් සානු ප්‍රදේශයේ අධික ජන සංඛ්‍යාවක් වාසය කරයි. (   )

12 ඩැකා, බීජිං යන නගර ගංගා නිම්න ආශ්‍රිතව පිහිටා ඇත. (   )

13 වසර පුරා පැතිරුණු අධික වර්ෂාපතනය නිවර්තන තෙත් දේශගුණික ප්‍රදේශවල ලක්ෂණයකි. ( )

14 දැව කර්මාන්තය බහුලව සිදුවන්නේ පතනශීලී වනාන්තර ප්‍රදේශවලයි. ( )

15 බිම්ස්ටෙක් සංවිධානය ලෙස හඳුන්වන්නේ බෙංගාල බොක්ක කලාපීය සංවිධානයයි. ( )

- අංක 16 - 20 දක්වා වූ ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

16 ආසියාන් සංවිධානයට අයත් රටවල් පමණක් ඇතුළත් කාණ්ඩය මෙම පිළිතුරුවලින් තෝරා ලියන්න.

(1) මියන්මාරය, බංග්ලාදේශය, නේපාලය, භූතානය

(2) මැලේසියාව, ලාඕසය, බෲනායි, පිලිපීනය

(3) බෲනායි, නේපාලය, ඉන්දියාව, තායිලන්තය

(4) මැලේසියාව, මියන්මාරය, ඉන්දියාව, බෲනායි

17 සම් භාණ්ඩ හා වානේ කම්හල් පිහිටා ඇති දිස්ත්‍රික්කය මින් කුමක් ද?

(1) ගම්පහ දිස්ත්‍රික්කය (2) කොළඹ දිස්ත්‍රික්කය

(3) කළුතර දිස්ත්‍රික්කය (4) කුරුණෑගල දිස්ත්‍රික්කය

18 මෙහි දැක්වෙන ප්‍රදේශවලින් සංචරණ සත්ව පාලනය සඳහා යොදාගන්නා ප්‍රදේශ අඩංගු වන්නේ කුමන පිළිතුරේ ද?

(1) උතුරු ආසියානු ප්‍රදේශය (2) ඉන්දියාවේ ඩෙකෑන් ප්‍රදේශය

(3) මධ්‍යම ආසියාවේ ස්ටෙප්ස් ප්‍රදේශය (4) ගිණිකොන ආසියානු ප්‍රදේශය

19 නව කාර්මික රටවල් ලෙස සැලකෙන ප්‍රදේශ වන්නේ මින් කුමන රටවල් කාණ්ඩය ද?

(1) මෙක්සිකෝව, හොංකොං, මැලේසියාව, චීනය

(2) චීනය, ඉතාලිය, ඉන්දියාව, දකුණු අප්‍රිකාව

(3) ඉන්දියාව, චීනය, හොංකොං, දකුණු කොරියාව

(4) හොංකොං, තායිවානය, සිංගප්පූරුව, දකුණු කොරියාව

20 කොළඹ නගරය වටා පවතින පුරවර ප්‍රදේශයෙහි ඇති කැපීපෙනෙන ලක්ෂණය මින් කුමක් ද?

(1) උපනගර හා ගැමිරික කලාප රැසක් තිබීම.

(2) භෞතික සම්පත් බහුල වීම.

(3) මහ නගර සභා පමණක් ඇතුළත් වීම.

(4) ප්‍රධාන වෙළඳ නගරය පමණක් ස්ථානගත වීම. (2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01 සපයා ඇති දකුණු ආසියාතික රටවල් දැක්වෙන සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) සිතියමේ දැක්වෙන පහත අක්ෂර වලින් පෙන්වා ඇති දෑ නම් කරන්න.




1. A වලින් පෙන්වා ඇති අක්ෂාංශ රේඛාව
2. B හා G වලින් පෙන්වා ඇති රටවල්
3. C වලින් පෙන්වා ඇති කාන්තාරය
4. D හා E පෙන්වා ඇති කඳුවැටි
5. F හා H පෙන්වා ඇති දූපත් (ල. 08)

(2) G හා B වලින් දැක්වෙන රටවල් අයිති ආසියානු කලාප නම් කර දක්වන්න.

(ල. 02)

(3) 1, 2, 3 හා 4 යන කලාපවලින් නිවර්තන දේශගුණය ඇති කලාපවල පිහිටීම අංක අනුව නම් කරන්න. ( ල. 02)

02 (1) නිල් ග්‍රහයාගේ වායුගෝලයේ අඩංගු ප්‍රධාන වායු වර්ග දෙකක් නම් කරන්න.

(ල. 02)

(2) ඉහත දැක්වූ වායුගෝලයේ පැවැත්ම නිසා නිල් ග්‍රහයා හා එහි ජීවීන්ට ලැබී ඇති වාසි තුනක් දක්වන්න. ( ල. 03)

(3) පහත සඳහන් භූ ලක්ෂණ පිහිටි රටවල් හෝ ප්‍රදේශ නම් කරන්න.

ගංගා නම් ගංගාව / හින්දු කුෂ් කඳු / ටිබෙට් සානුව / සිංදු ගංගා තැන්න / හොවැංහෝ ගඟ / මිසිසිපි ගඟ / බෝල්ටික් පලිහ (ල. 07)

03 (1) පහත දැක්වෙන ලක්ෂණ අඩංගු ආසියානු කලාපය ඉදිරියෙන් ලියා දක්වන්න.

1. ජන හීන කලාපයකි.
2. ප්‍රධාන පෙළේ කාර්මික රටවල් ඇත.
3. කඳු, සානු හා තැනිතලා බහුලය.
4. මෝසම් වනාන්තර ඇත.

5. වියළි කාන්තාර ලක්ෂණ ඇත.
(ල. 05)

(2) ආසියානු කලාපය තුළ ඇති දේශගුණ වර්ග 2 ක් නම් කර ඉන් එක් දේශගුණ වර්ගයක ලක්ෂණ දක්වන්න. (ල. 04)

(3) ආසියානු කලාපයේ පවතින ස්වාභාවික සම්පත් 3 ක් දක්වන්න. (ල. 03)

04 ජන සමාජයක දක්නට ලැබෙන සියලුම කටයුතු මෙහෙයවන බලවේගය සංස්කෘතිය වේ. සමාජය මගින් පරම්පරාවෙන් පරම්පරාවට පවරා දෙන සංස්කෘතික අංග අනුව සංස්කෘතියේ පැවැත්ම රඳාපවතී.

(1) රටක සංස්කෘතියේ ස්වභාවය වෙනස්වීමට බලපාන සාධක තුනක් දක්වන්න.

(ල. 03)

(2) සෑම සංස්කෘතියකටම පොදු වූ අංග තුනක් දක්වා ඒ සඳහා ශ්‍රී ලංකාවෙන් උදාහරණ ගෙන දක්වන්න. (ල. 04)

(3) ලෝකයේ සංස්කෘතික උරුමයන් ලෙස සැලකෙන ස්පර්ශ උරුම 3 ක් නම් කර ඉන් දෙකක් පිළිබඳව විස්තර කරන්න. (ල. 05)

05 (1) පහත දැක්වෙන්නේ ලෝකයේ විවිධ රටවල පවතින කෘෂිකාර්මික වර්ග ආශ්‍රිත ලක්ෂණ කීපයකි. එම ලක්ෂණ අයත් වන කෘෂිකාර්මික වර්ගය දක්වන්න.

1. කෘෂි බිම් වරින් වර මාරු කිරීම.
2. පරිභෝජන අවශ්‍යතා සඳහා බෝග වගා කිරීම හෝ සත්ත්ව පාලනය
3. ප්‍රාථමික නිෂ්පාදන ලෙස වෙළඳපලට එකතුකරන භෝග වැවීම.
4. වියළි කාන්තාරවලට මායිම් වූ තෘණ බහුල ප්‍රදේශවල කෙරෙන කෘෂිකර්මය.

(ල. 04)

(2) වාණිජ පදනමකින් නිෂ්පාදන කර්මාන්ත ඇතිවීම ආසියානු කලාපයේ වර්තමානයේ කැපී පෙනේ. ඊට බලපා ඇති හේතු 2 ක් සඳහන් කරන්න. (ල. 04)

(3) ආසියානු කලාපයේ කර්මාන්තවල විශේෂ ලක්ෂණ 2 ක් දක්වා එම ලක්ෂණවලට සුවිශේෂ වූ කර්මාන්ත සඳහන් කරන්න. ( ල. 04)

06 (1) (a) ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයට අයිතිවන සිතියමක් මෙහි දැක්වේ. එහි අංක වූ අංක 1 සිට 5 දක්වා පවතින දිස්ත්‍රික්ක නම් කරන්න.

(b) එම ප්‍රදේශයේ A සිට E දක්වා පවතින දිස්ත්‍රික්කවලට පොදු වූ ප්‍රධාන නගර අක්ෂර යොදා නම් කරන්න. (ල. 05)




(2) උතුරු ප්‍රදේශයේ පවතින මානුෂ කටයුතු 2 ක් හා කර්මාන්ත දෙකක් දක්වන්න.